**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 272 කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට ( ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කුලියාපිටිය(නැගෙනහිර), උඩුබද්දාව, මල්ලවපිටිය, රස්නායකපුර හා ගල්ගමුව යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05ක ස්ථාපිත කර වර්ෂ 16 ක සිට වර්ෂ 60ක් පමණ කාලයක් ඉක්මවා ගොස් ඇතත් එම කාර්යාල පිහිටි ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර එම ඉඩම් වල වටිනාකම තක්සේරු කර දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව. | ඉඩම් පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාළව ඉදිකරන ලද සේවා පියස ගොඩනැගිලි 16 ක් සඳහා වැයකරන ලද රු.6,590,261 ක වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | වැයකරන ලද මුදල් ඉදිරියේදී ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගොඩනැගිලි වටිනාකම ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම්ගත කළ යුතුය. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගැස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ප්‍රාදේශීය | යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාල 10 ක ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලින කර නොතිබුණි. | | යාවත්කාලීන කිරීමට කටයුතු කලයුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි විදුලි උපකරණ ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | බැරකම් ලේඛනයක් නිසි පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | බැරකම් දෛනිකව පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 14.11 වගන්තිය | 13,905,291 | නිලධාරියෙකුගේ සේවය අවසන් කල හොත් ණය මුදලෙන් එතෙක් නොගෙවා ඇති ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් නිත්‍යානුකූලව අයකර ගැනීම සඳහා 23 වැනි පරිශිෂ්ඨයේ වූ විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කල නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබාගත යුතු වුවද, ප්‍රාදේශිය ලේකම් | අතපසුවීමක් නිසා 23 වැනි පරිශිෂ්ඨය ලබාගෙන නොමැති අතර විගණනයෙන් පෙන්වා දුන් පසු එම ප්‍රකාශන ලබා ගෙන ගොනු වලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ණය මුදල් ලබාදීමේදී අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබාගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කාර්යාල 6 ක සේවය කරන නිලධාරින් 85 දෙනෙකුගෙන් මෙවැනි ප්‍රකාශනයක් ලබා නොගෙන ණය මුදල් ලබාදී තිබුණි. | | |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 38,094,253 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක කොන්ත්‍රාත් රැඳවුම් මුදල් වර්ෂ 02 ක සිට වර්ෂ 05කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ව්‍යාපෘතිවල අඩුපාඩු පැවතීම හා අත්මුදල් නොලැබීම හේතුවෙන් නිරවුල් කළ නොහැකි වූ බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |
| **(ඇ)** | 2018 ජනවාරි 24 දිනැති අංක .2/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | චක්‍රලේඛ ප්‍රකාරව සෑම වර්ෂයකම, නිලධාරියෙක් සඳහා අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සලසා දිය යුතු වුවත්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි තනතුරු 11 කට අදාළව නිලධාරින් 2848 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුල කිසිදු පුහුණු අවස්ථාවක් ලබාදී නොතිබුණි. | 2023 දී පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීමට හැකි පරිදි පුහුණු සැලැස්මක් සකස් කළ ද, මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබානොදුන් බැවින් පුහුණු අවස්ථා ලබාදීමට නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | 2019 ජූනි 27 දිනැති අංක.05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ) වගන්තිය | **40,150** | රිදීගම හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 හි වැඩ තහනමට ලක්වූ නිලධාරින් දෙදෙනෙකුට අදාලව අයවිය යුතු ආපදා හා | රිදීගම ග්‍රාම නිලධාරින්ගේ 2024 ජනවාරි රු.2,000 ක මුදලක් අයකරගෙන | ණය ශේෂ අය කර ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දේපල ණය ශේෂයන් වර්ෂ 5 සිට වර්ෂ 20 දක්වා කාලයක් අය නොවී පැවතුණි. | ඇති අතර තවදුරටත් රු.14,150 ක මුදලක් අයවිය යුතුව ඇත. නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියාට අදාළ මුදල ගෙවන ලෙස ලිපි යවා ඇති බව. | |
| (ඉ) | 2020 සැප්තැම්බර් 18 දිනැති අංක.16/2020 දරන අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ 10 ඡේදය | ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරි විසින් මාස 4 කට වරක් සෑම ග්‍රාම නිලධාරි කාර්යාලයක්ම පරීක්ෂාවට ලක්කල යුතු වුවද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අයත් ග්‍රාම නිලධාරි වසම් 109 ක ග්‍රාම නිලධාරි කාර්යාල එක් වරක් හෝ පරීක්ෂාවට ලක් වී නොතිබුණි. | පරීක්ෂා කිරීම මඟහැරී ගොස් තිබූ බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 20 ක් සඳහා ජපන් ජබර ආශ්‍රිත නිෂ්පාදනයන් සිදුකරන කර්මාන්ත ශාලාවක් ආරම්භ කර මහන මැෂින් ඇතුළු උපකරණ ලබාදීම සඳහා රු.9,016,765 ක් වැයකර තිබුණ ද ප්‍රතිලාභියෙකුගේ මාසික ආදායම රු.4,105 ක් පමණ වීමෙන් ව්‍යාපෘතිය අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. | නව වෙළඳපල අවස්ථා හා වෙළඳපල උපක්‍රම හඳුන්වාදීමත් නවීන වෙළඳ ප්‍රචාරණ ක්‍රම හරහා වෙළඳපල අවස්ථා ව්‍යාප්ත කිරීමටත් කටයුතු කරමින් පවතින බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ සපුරා ගැනීමට හැකිවන ආකාරයට ඉටුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ 2021 හා 2023 වර්ෂවලදී බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වලලිය හා කඩිහාරය වසම් සඳහා රු 4,760,777.ක වියදමින් වළං කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණ ද නියැදි පරීක්ෂණයට අනුව රු 480,000.ක ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් 06 දෙනෙකු විසින් වළං මඩු හා ලබාදී තිබුණ උපකරණ භාවිතයට ගෙන නොතිබුණි. | අදාළ උපකරණ භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියේ උපකරණ නිසි පරිදි භාවිතා කළයුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ රු.732,000 ක වියදමින් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැව් 03 ක ආක්‍රමණික ශාක ඉවත් කිරීම සිදුකර තිබුණද, ව්‍යාපෘතිය නිමකර වර්ෂ 1 ½ ක් වැනි කෙටි කාලයක් තුළදී නැවත සම්පූර්ණ ජල තලය ආක්‍රමණික ශාක වලින් වැසී තිබුණි. අදාල ප්‍රදේශයේ ජනතාව සම්පත් තිරසර භාවිතයට හා නඩත්තුවට යොමු නොවීම හා වගකිව යුතු නිලධාරීන් ඒ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම තුළ මෙම වැයකල මුදල නිෂ්කාර්යය බවට පත්ව තිබුණි. | ඉදිරියේදී අඛණ්ඩව ජලජ ශාක ඉවත් කිරීමට කටයුතු කරන ලෙසට ගොවි සංවිධාන දැනුවත් කරන බව. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවන පරිදි ව්‍යාපෘති නිම කිරීමෙන් පසු අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ප්‍රජාව උනන්දු කළ යුතුය. |
| (ඈ) | වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර මිලියන 03 වැඩසටහනට අදාළව රු.261,875 ක මුදලින් කැඳත්තාව වෙල් යායේ කදිරාගල ඇල මාර්ගයේ ඉවුරු සංරක්ෂණය කර තිබුණද, ඇළ මාර්ගයේ ස්ථාන කිහිපයකින් පස් බැමි කැඩී ගොස් තිබුණු අතර, වර්ෂා කාලයේදි කුඹුරු ඉඩම්වල වැලි තැන්පත්වීම හා දින ගණනාවක් ජලය පිරී තිබුම හේතුවෙන් අක්කර 150ක් පමණ වන කුඹුරු යායේ ගොවිතැන්කටයුතු නිසි කාලයට සිදුකළ නොහැකිව තිබුණි. වගාබිම් වෙත කෘෂි යන්ත්‍රෝපකරණ රැගෙන යාමට හැකිවන පරිදි මාර්ග පහසුකම් සකසා නොතිබීම හේතුවෙන් යන්ත්‍රෝපකරණ ප්‍රවාහනයේදී ඉවුරුවලට හානි සිදුවී තිබුණි. ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී මේ සම්බන්ධව අවධානය යොමු නොකිරීමෙන් වැය කරන ලද මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි. | ට්‍රැක්ටර් පැන්නුම් සකස් කිරීමට මුදල් ප්‍රමාණවත් වී නොතිබුණ අතර මෙම ඇළ මාර්ගයේ නඩත්තු කටයුතු කරගෙන යාම සඳහා සහ වර්තමානයේ ඇති වී ඇති තත්ත්වය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන ව්‍යාපෘතිය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අවුලේගම ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරි දැනුවත් කර ඇති බව. | ව්‍යාපෘති ඉටුකිරීමේදී ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට හැකිවන ආකාරයට ඉටුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු.851,250 ක ප්‍රතිපාදන මත 2023 වර්ෂයේදී දෙල් වගාව ප්‍රචලිත කිරීම හා අලෙවි පිළිබඳ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක් තුළ එක් කොට්ඨාශයක් සඳහා දෙල් පැල 50 බැගින් ප්‍රතිලාභීන් 50 දෙනෙකු සඳහා දෙල් පැල 750 ක් හා දෙල් විජලනය සඳහා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එක් ප්‍රතිලාභියෙකුට සුළු පරිමාණ විජලන යන්ත්‍රයක් ඇතුළු වෙනත් යන්ත්‍ර 03 ක් ලබාදී තිබුණි. දෙල් විජලනය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක ඵලදාව මාස්පොත ප්‍රදේශයට ප්‍රවාහනය කිරීමට හෝ විජලන යන්ත්‍රය එම ප්‍රදේශ කරා රැගෙන යාමට අධික පිරිවැයක් දැරීමට සිදුවීම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබීම, විජලිත දෙල් ආශ්‍රිත නිෂ්පාදනවල වෙළඳපල මිළ අධිකවීම, හා අපනයන ක්‍රමවේදයක් සකස් කර නොතිබීම සහ ලබාදී තිබූ දෙල් පැල 750ක ප්‍රමාණය මුල් පැල (ලේයර්) වූ අතර, ලේයර් පැලයක අස්වැන්න ලබාගැනීමට වසර 03 කට අධික කාලයක් ගතවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ප්‍රායෝගික තත්ත්වයෙන් බැහැර ව්‍යාපෘතියක් බවට පත්ව තිබුණි. | මෙම ව්‍යාපෘතිය සිදු කිරීමේදී කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ලබා දී තිබූ උපදෙස් වලට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ දෙල් වගාව බහුලව සිදු කරන ඉහළ දෙල් ඵලදායිතාවක් ලැබෙන කොට්ඨාස තෝරා ගෙන තිබූ අතර ආදායම් උත්පාදනය හා අපනයනය මේ තුළින් අපේක්ෂිතව තිබුණද බද්ධ දෙල් පැළ සොයා ගැනීමට අපහසු වූ බැවින් ලේයර් පැළ ගොවියන් වෙත ආදාළ නිර්ණායකයන්ට අනුකූලව බෙදා දී තිබුණි.එම පැළ මඟින් වසර 03 දී ඵලදාව ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘති ඉටුකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට කටයුතු කල යුතුය. |
| (ඊ) | 2018/2019 වර්ෂවලදී ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කල ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියර යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ධාරිතා සංවර්ධනය, චක්‍රීය ණය වැඩසටහනට අදාළ අරමුදල් වෙනුවෙන් වෙන් කළ රු.178,789,500ක මුදලින් සියයට 44 ක් වන රු.77,963,280 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන පැවතුණි. | අදාල මුදල් වියදම් කිරීමට සමිතිවලින් විවිධ යෝජනා ඉදිරිපත් වී ඇති බැවින්, අදාල යෝජනා ලබාගෙන එම වැඩසටහන් ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ අරමුණ ඵලදායී ලෙස ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හා 2022 ගම සමඟ පිළිසඳර වැඩසටහන මඟින් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රන්තැටිකන්ද වසමෙහි සුළු අපනයන බෝග ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා අදාල යන්ත්‍ර සූත්‍ර සැපයීම වෙනුවෙන් රු.5,322,414 ක මුදලක් වැයකර තිබුණද, අදාල යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම අවම මට්ටමක පැවතීම තුළින් ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අස්වැන්න නෙලන කාලය තුළදී යන්ත්‍ර භාවිතයට ගැනිමට අපේක්ෂා කරන බව. | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කිරීමට හැකි වන ආකාරයට උපකරණ නිසි පරිදි භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | 2021 වර්ෂයේ ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය (නැගෙනහිර),වීරඹුගෙදර,බමුණාකොටුව හා ඉබ්බාගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 හි රු.4,822,027 ක මුළු වියදමින් ඉදි කර ඇති ග්‍රාමීය වොලිබෝල් ක්‍රීඩාංගන 04 ක් සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට නොගෙන හා නඩත්තුවකින් තොරව පැවති අතර, ඉබ්බාගමුව, ඇහැටුවැව, නාරම්මල හා පොල්පිතිගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ට අදාලව රු.5,749,404 ක මුළු වියදමක් දරා ඉදිකර තිබූ ග්‍රාමීය වොලිබෝල් ක්‍රීඩාංගන 04 ක වැඩ නිමකර නොතිබීම හේතුවෙන් වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ක්‍රීඩාංගන නඩත්තුව හා භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණූ ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (එ) | 2021 වර්ෂයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදුල්ගොඩකන්ද ග්‍රාම නිලධාරි වසමේ කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන වැඩසටහනට රු.1,256,563 ක් වැයකර තිබුණද, ආදායම් උත්පාදනය ඉතාඅඩු මට්ටමක පැවති අතර, කටුපිටිය උතුර වසමේ රු.1,631,000 ක වියදමින් ක්‍රියාත්මක කල කොහු බුරුසු නිෂ්පාදන ව්‍යාපෘතියට ලබාදුන් කොහු අඹරන යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතුණි. | අපනයනය සංවර්ධන නිලධාරීන්ගේ මැදිහත්වීම මත අලෙවිකරුවන් හඳුනාගැනීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී මෙම උපකරණ උපරිමයෙන් භාවිතයට ගැනීමට අපේක්ෂා කරන බව. | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණ ඉටුවන පරිදි ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිකර ගැනීමට ක්‍රියාකළ යුතු අතර ලබාදුන් උපකරණ භාවිතා කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කල අඹන්පොල ජල ව්‍යාපෘතිය හා අංක 425 කටුපොත යුනිට් 03 ජලයෝජනා ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීම සඳහා පිළිවෙලින් රු.1,979,418 ක් හා රු.3,959,328 ක් 2020 වර්ෂයේදී වැය කර තිබුණද, ජල මූලාශ්‍රයේ සිට ටැංකිය දක්වා ජල නල එලීම සම්පූර්ණ කර නොතිබීම, ජල ටැංකියේ සිට පාරිභෝගිකයන් දක්වා ජලය ගෙන යාමට නල පද්ධතියක් සකස් කර නොතිබීම, විදුලිය ලබා නොගැනීම යන කරුණු හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක | ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ඉටුකිරීමට සූදානම් කර ඇති බව. | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණ ඉටුවන ආකාරයට හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරයට ක්‍රියාක්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොවීමෙන් වැය කළ මුදල නිෂ්කාර්ය බවට පත්ව තිබුණි. | | |
| (ආ) | කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වඩුගෙදර ග්‍රාම නිලධාරි වසමේ වඩුගෙදර ජල ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ පළාත් නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ රු.1,990,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කාර ආයනය සමුපකාර සමිතිය වෙත රු.381,998 ක් ගෙවා තිබුණ අතර කාර්මික නිලධාරී නිර්දේශය නොමැති වීම හේතුවෙන් තවදුරටත් රු.1,589,208ක මුදලක් අදාළ ආයතනය වෙත ගෙවිය යුතු තිබුණි. ඉදිකිරීම් කටයුතු සිදුකර වර්ෂ 8ක් පමණ ගතවී ඇතත්, විදුලි සම්බන්ධතාවයන් හා වතුර මෝටර් ලබාදී නොතිබීම හේතුවෙන් ජල හිඟයෙන් පීඩා විඳින පවුල් 150 ක පමණ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබූ අතර, ව්‍යාපෘතියට වැයකල මුදල නිෂ්කාර්ය වී තිබුණි. | 2014 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා රු.381,997ක මුදල 2015 වර්ෂය සඳහා අවිච්ඡේද කරන ලද අතර, සංවර්ධන කටයුතු නැවත ආරම්භ කළ පසු ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ප්‍රාදේශිය සභා පොදු අරමුදල් යොදවා නිම කිරීමට ප්‍රාදේශිය සභාව එකඟතාව පලකර ඇති බව. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි වැඩ අවසන් කර අදාළ ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනවත් වන පරිදි ව්‍යාපෘති වල ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය. |

**3.3** **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදගෙදර ග්‍රාම නිලධාරි වසමෙහි ඉහළ වල්පොල ගමෙහි පිහිටි හෙක්ටයාර් 0.8016 ක් වන ඉඩම රණවිරුවන් හෝ ඔවුන්ගේ පවුල් අතර බෙදාදීම සඳහා 2000 වර්ෂයේදී පරිත්‍යාගශිලියෙකු විසින් රජයට පරිත්‍යාග කර තිබුණි. ඉඩම් කච්චේරි පැවැත්වීම මගින් මෙම ඉඩම බෙදා දීමට කටයුතු නොකර එලදා බදු වශයෙන් වෙනත් පාර්ශවයක් වෙත ලබාදී තිබුණ අතර, ඉඩම පරිත්‍යාග කර වර්ෂ 23 ක් ගතවී ඇතත්, අදාල ඉඩම නියමිත කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි. | ඉඩම් කච්චේරි පැවැත්වීමට හා වැඩිදුර උපදෙස් ලබාගැනීමට පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලිපි යොමුකර ඇති බව. | පරිත්‍යාගකරුගේ අරමුණ ඉටුවන ආකාරයට කටයුතු කල යුතුය. |

### 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රු.9,627,428 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල වාරියපොල කළුගමුව මාර්ගයේ ගොන්නව පාලම සිට බමුණාකොටුව මංසන්ධිය දක්වා ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය හා රු.4,746,457 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2014 වර්ෂයේදී මුදල් ගෙවා තිබුණ ද, වසර 10 කට ආසන්න කාලයක් මෙම ව්‍යාපෘති දෙකෙන්ම ජනතාවට ජලය ලබාගැනීමට නොහැකිවීමෙන් වැයකරන ලද රු.14,373,885 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි. | ජල සම්පාදන මණ්ඩලයෙන් දිගින් දිගටම ප්‍රගතිය විමසීමේදී දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ජලනල මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවක් සකස් කරමින් පවතින බව දැනුම් දෙන ලදි. බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අවසර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | මනා අධ්‍යයනයකින් පසුව ව්‍යාපෘති විධිමත්ව සැලසුම් කළ යුතු අතර ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව, ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකල යුතුය. |

### 3.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක.02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 102 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර තිබුණද, වාර්තාවේ 4 ඡේදයේ කාර්යසාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සංරචක 13 ක් යටතේ දක්වා ඇතත්, ග්‍රාමීය විදුලිය, සූර්ය පැනල/විදුලිය (නිවාස ඒකක සඳහා) හා නිල නොවන යන ව්‍යාපෘති සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කර නොතිබුණි. | 2023 වර්ෂයේ ලැබුණ ප්‍රතිපාදන සීමිත වීම මෙයට හේතු වී ඇති බව දන්වා ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සකස් කර තිබූ කාර්යසාධන දර්ශක අනුව ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, සනීපාරක්ෂක පහසුකම් හා සුළු වාරිමාර්ග යන සංරචක තුනෙහි සත්‍ය නිමවුම් මට්ටම සියයට 49 ට අඩු මට්ටමක පැවතුණි. | 2023 වර්ෂයේ බොහෝ ව්‍යාපෘති සඳහා සැලසුම් කළ පරිදි ප්‍රතිපාදන නොලැබීම මෙයට හේතු වී ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී පොල්ගහවෙල කොට්ඨාශයේ කුඩා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජුකී මැෂින්, ඕවර් ලොග් මැෂින්, මෝටර්, මේස විදුලි ඉස්ත්‍රික්ක වැනි භාණ්ඩ වර්ග 08 ක භාණ්ඩ ඒකක 68 ක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සිදුකළ විගණන භෞතික පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 06 දෙනෙකු විසින් ලබාගත් ජුකී මහන මැෂින් හා උපාංග ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණ අතර, එක් ප්‍රතිලාභියෙකු සඳහා ලබාදුන් ජුකී මහන මැෂිමක් හා එයට අදාල උපාංග එම නිවසේ නොතිබුණි. | ප්‍රතිලාභීන් සමඟ සාකච්ඡා කර, ඌන උපයෝජන සහිත ප්‍රතිලාභීන්ගේ උපකරණ ආපසු පවරා ගැනීම සහ අස්ථාන ගතවී ඇති ජුකි මැෂින් වලට නිසි පිළිතුරු ප්‍රතිලාභීන් වෙතින් ලැබී නොමැති වුවහොත් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | ව්‍යාපෘතිය ඉටුකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන අකාරයට ඉටුකළ යුතුය. |

## 3.7 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනේගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ හෙක්ටයාර් 0.318 ක් පමණ වූ බිම් ප්‍රමාණය තුල 2010 වර්ෂයේදී පමණ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටුවා තිබුණු අතර, මෙම ඉඩම් කොටස ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වෙත පවරා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත භුක්තිය භාරදීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | ඉඩම් නීත්‍යානුකූලව පවරාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මල්ලවපිටිය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර විද්‍යාලය පිහිටා ඇති ඉඩමෙන් හෙක්ටයාර් 0.2645 ක බිම් කොටසක මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වර්තමානයේ පවත්වාගෙන යනු ලබන අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද මෙම ඉඩම් කොටස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගෙන නොතිබුණි. | මෙම ඉඩම පළාත් පාසලක් ලෙස පවත්වා ඇති බැවින් මේ සම්බන්ධව නිරීක්ෂණ වාර්තාවක් ලබාගැනීම සඳහා වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙතින් ඉල්ලීමක් කර ඇති බව. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටි ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 109 පොතානේගම ග්‍රාම නිලධාරි වසමේ අවසාන ගම් පිඹුරේ 2146 මොළගම ගමෙහි මොළගම වැව ආශ්‍රිත ප්‍රදේශයේ අක්කර 100 ක පමණ ප්‍රමාණයක් 2023 අගෝස්තු මසදී පමණ අනවසරයෙන් හෙළිකර බඩ ඉරිගු වගාවක් සිදුකර තිබුණ අතර, මෙම ප්‍රදේශයේ මායිම් නිශ්චිතව හඳුනාගැනීම සඳහා කුරුණෑගල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයා විසින් 2023 මාර්තු 22 දින මැනුම් කර ඇතත් ඒ සම්බන්ධයෙන් අනුරේඛන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසර කරුට ඉවත්වන ලෙස දැනුම් දී ඇති අතර මැනුම් කටයුතු කර ඇතත් අදාළ අනුරේඛනය ලැබී නොමැති අතර අනුරේඛනය ලැබීමෙන් පසු නෛතික ක්රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | රජයට අයත් ඉඩම් අනවසර පුද්ගලයින් අල්ලාගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල වූ දීමනාපත්‍ර ඉඩම්වල පර්චස් 66.9 කට වැඩි ඉඩම් ප්‍රමාණයක් රජයේ අනුමැතියකින් තොරව සන්නිවේදන කුළුණු 04 ක් ඉදිකිරීමට ලබාදී තිබුණ අතර, මෙම කුළුණු මගින් අදාල දීමනා පත්‍ර හිමියන් විශාල ආදායමක් උපයාගෙන තිබුණ අතර, අදාල ඉඩම් කොටස් විධිමත්ව රජයට පවරා ගෙන බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි. | දීමනා පත්‍ර රජයට භාරගෙන සන්නිවේදන කුළුණු ස්ථාපිත කර ඇති දින සිට බදු අයකිරීමට කටයුතු කරන බව. | රජයට අයත් ඉඩම් කොටස් විධිමත්ව රජයට පවරාගෙන බැහැර කිරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 කට අයත් ඉඩම් අක්කර 80 ක පමණ ඉඩම හා එහි පිහිටි ගොඩනැගිලි 60 ක් නිෂ්කාර්යව පැවති අතර ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණි. | ඉඩම් නිෂ්කාර්ය වීමට විවිධ හේතු බලපා ඇති බවත් ප්‍රයෝජනවත් කාර්යයන්ට යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | නිෂ්කාර්යව පවතින දේපල සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඊ) | මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අංක 196 දළදාගම ග්‍රාම නිලධාරි වසමේ දළදාගම ගමේ අ.ග.පි. 1979 හි පත්‍ර අංක 09 අතිරේක අංක 03 හි කැබලි අංක 355 දරන බිම් කොටසෙහි පිහිටි හෙක්ටයාර 0.622 ක් වන රජයේ ඉඩම ස්වදේශ කටයුතු | ඉඩම පවරාගැනීමට අවශ්‍ය ඉල්ලීම් ලිපිය අමාත්‍යාංශය වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා ඇති බව. | රජයට අයත් ඉඩම් කොටස් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යාංශය වෙත පවරා භුක්තිය ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 25-5707 දරන කැබ්රථය 2011 මැයි 20 දින අනතුරට ලක්වී මු.රෙ.104 (4) පරීක්ෂණ වාර්තාව අනුව හානියේ වටිනාකම රු.114,650 ක් වී තිබුණි. අනතුරෙන් පසුව වාහන අළුත්වැඩියාව සඳහා නිසි ක්‍රියාමාර්ග නොගැනීම හා සුදුසු පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2011 වර්ෂයේ සිට මෙම රථය නිෂ්කාර්යව පැවතුණි. 2023 වර්ෂයේ පත්කල විශේෂ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව මෙම අළුත්වැඩියාව සඳහා සමාලෝචිත වර්ෂය වන විට රු. 1,500,000 ක් පමණ වැය කිරීමට සිදුවන බවත් දක්වා තිබුණි. | රථය අලුත්වැඩියාව සම්බන්ධයෙන් තවදුරටත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මගින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන බවත් දන්වා ඇති බව. | නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගත යුතුය. |
| (ඈ) | ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංචිත වාහනය ලෙස භාවිතා කර 2013 නොවැම්බර් 27 දින සිට ධාවනයෙන් ඉවත් කර තිබූ අංක 52 -6128 දරන කැබ් රථය 2014 වර්ෂයේදී මෝටර් රථ පරීක්ෂක විසින් පරීක්ෂා කර වාහනයේ ඉන්ධන පද්ධතිය සේවා කර අළුත් බැටරියක් යොදා වාහනය පරීක්ෂා කළයුතු බව දක්වා තිබුණද, අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වර්ෂ 10 ක පමණ කාලයක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි. 2014 වර්ෂයේදී අඩු වටිනාකමට අළුත්වැඩියා කළ හැකිව තිබූ මෙම රථයේ 2023 වර්ෂයේ අලුත්වැඩියා සඳහා වන දළ ඇස්තමේන්තුව රු.1,800,000 ක් බව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පත්කරන ලද අපහරණය කළ යුතු වාහන හඳුනාගැනීම සඳහා වන විශේෂ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව දක්වා තිබුණි. | රථය අලුත්වැඩියාව සම්බන්ධයෙන් තවදුරටත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මගින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන බව | නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගත යුතුය. |
| (එ) | සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ NWHA– 8867 දරන ට්‍රැක්ටර් බවුසර් රථය 2014 ආගෝස්තු 21 දින සිට අක්‍රිය බවට පත්වී වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණද, අපහරණ කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සමාජසේවා දෙපාර්තමෙන්තුවෙන් විමසුවද සුදුසු උපදෙස් ලැබී නොමැති බව | නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගත යුතුය. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 වර්ෂයේ ගම සමඟ පිළිසදරක් මිලියන 20 වැඩසටහන යටතේ රු.960,874 ක වියදමින් තෙළඹුගල්ල පාසැල් ක්‍රීඩාපිටිය මායිමේ ඇති ඇළ පිලිසකර කර ඉදිකර තිබූ ආරක්ෂිත බැම්ම සම්පූර්ණයෙන්ම ගැලවී ගොස් තිබුණ අතර, මේ හේතුවෙන් වැයකර තිබූ මුදල් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | පාසල් සංවර්ධන සමිතිය වෙත මෙම බැම්ම නැවත ප්‍රතිසංස්කරණය කරන ලෙස උපදෙස් ලබා දී ඇති අතර රඳවුම් මුදල් මේ වන තෙක් ගෙවා නොමැති බව. | ව්‍යාපෘති ඉටුකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකල යුතුය.. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදැල්පොල වසමේ 2010 වසරේදී රු.මිලියන 10 ක් පමණ වැයකර පානීය ළිඳක් පෞද්ගලික ඉඩමක ඉදිකර තිබුණද එම ඉඩම රජය වෙත පවරාගෙන නොතිබුණි. පසු කාලීනව ඉඩම්හිමියා විසින් ඊට විරුද්ධත්වය ප්‍රකාශ කළ බැවින් ළිඳ පිහිටි ඉඩම 2019 සැප්තැම්බර් 19 දින පිස්කල් මගින් භාරගෙන ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත භාරදී තිබුණි. මෙහි මෝටර් කාමරය කඩා දමා තිබුණ ද ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට හෝ ළිඳ නඩත්තු කිරීමට හා සන්තකය තබා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය වයඹ පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර ඇති අතර වර්තමානය වන විට ගැටලුකාරි තත්වයක් පවතින බව. | රජයේ අරමුදල් යොදවා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර ඉඩම් නිසි පරිදි රජයට පවරාගෙන ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතු වීම. |
| (ආ) | නිකවැරටිය, වාරියපොල, ගනේවත්ත, පඩුවස්නුවර(බටහිර), පොල්පිතිගම යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාළ දැදුරු ඔය දකුණු ඇල ව්‍යාපෘතිය සඳහා වන්දි මුදල් වශයෙන් රු.2,008,998,318ක මුදලක් ගෙවා තිබුණු අතර වන්දි මුදලට අමතරව ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් පොලි වශයෙන් රු.46,190,594 ක් ගෙවා තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ පනතට අනුව එක් එක් අදියරයන් සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් මෙසේ පොලී ගෙවීමට සිදුවන බව. | ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි නියමිත කාලය තුල ගෙවීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂයේ ස්වාභාවික ආපදා මගින් සිදු වී ඇති දේපළ හානි සඳහා වන්දි වශයෙන් ජාතික ආපදා සහන මධ්‍යස්ථානයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක හානියට ලක්වූ පුද්ගලයින් වෙත රු.11,515,317 ක වන්දි මුදලක් ලැබිය යුතුව පැවතුණි. | රු.3,814,692 ක ප්‍රතිපාදන ඉල්ලීම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකරන බව. | හානියට ලක්වූ පාර්ශවයන්ට වන්දි මුදල් ලබාදීමට කඩිනමින් කටයුතු කළයුතුය. |
| (ඈ) | ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ රු.970,000ක වියදමින් නෑඹිලිකුඹුර ක්‍රීඩාපිටිය වැඩ අඩක් නිමකර තිබූ අතර, මෙම වැඩ කොටස් නිමකර වසරකට අධික කාලයක් ගතවී ඇතත් ඉදිකර තිබුණ ගොඩනැගිල්ලේ වහලය සෙවිලි කර නොතිබීමෙන් සකස් කර ඇති ගොඩනැගිල්ල විනාශ වී යාමේ අවධානමකට ලක්ව තිබුණි. | සමිතියේ අරමුදල් මඟින් හෝ වෙනත් ආකාරයකින් වහලය සකසා ගන්නා ලෙස අදාළ සමිතියට ලිපියක් මඟින් දැනුවත් කර ඇති බව. | ව්‍යාපෘති ඉටුකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට කටයුතුකල යුතුය. |
| (ඉ) | කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ග්‍රාමීය ආර්ථික අංශය මගින් ප්‍රදේශවල අඩු අදායම්ලාභීන්ගේ ජීවනෝපාය දියුණු කර ඔවුන්ගේ ජීවන මට්ටම උසස් කිරීමේ අරමුණින් ගෘහාශ්‍රිත එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතියක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට රු.6,965,000 ක ප්‍රතිපාදිත මුදලින් රු.4,987,000 වියදම් දරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 21 ක ක්‍රියාත්මක කර තිබුණ නමුත්, රජයේ ගොවිපලවල මිළදී ගැනීමට එළු පැටවුන් නොමැතිවීම සහ පෞද්ගලික සැපයුම්කරුවන් ණය පදනම මත එළුවන් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ 09 සඳහා සැපයුම්කරුවන් ණය පදනම මත එළුවන් ලබාදීමට ඉදිරිපත් නොවූ නිසා රජයේ හා පෞද්ගලික ගොවිපලවල් වලින් මිලදී ගැනිම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිදු නොකරන ලද බව. | -එම- |
| (ඊ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කුලියාපිටිය (බටහිර), කොබෙයිගනේ, පන්නල, මල්ලවපිටිය සහ රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති 45 ක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වර්ෂ 02 සිට වර්ෂ 47 දක්වා කාලයක් ප්‍රමාද වී ඇතත් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | භුක්තිය භාර ගැනීමේ ගැසට් පත්‍රය ලැබී ඇතත් අත්පත් කරගත් කොටස හඳුනාගත නොහැකි වීම හේතුවෙන් නැවත මැනුම් කටයුතු කරමින් පවතින බව. | සංවර්ධන ව්‍යාපෘති ඉටුකිරීම සඳහා අවශ්‍ය ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි සම්පත් පැතිකඩ අනුව, තාවකාලික නිවාස 4,744 ක් , අනවසර පදිංචි 6,596 ක්, විදුලිය රහිත නිවාස 3,908 ක්, අනාරක්ෂිත ළිං 17,372 ක්, අර්ධ ස්ථිර නිවාස 33,513ක්, වල වැසිකිළි 3,818 ක්, වැසිකිළි නොමැති නිවාස 7,654ක්, පදිංචියට නිවසක් නොමැති පවුල් 4,505ක් පැවතියදී දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම ගැටළුවලට විසඳුම් ලැබෙන පරිදි යෝජනා සකස් කර ප්‍රතිපාදන උපයෝජනය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | අදාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | දිස්ත්‍රික්කය තුළ පවතින ගැටළු වලට විසඳුමක් ලෙස ව්‍යාපෘති සැලසුම් කර ඵලදායිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි විශ්‍රාමිකයන් 747 දෙනෙකු සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු.157,490,678 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.97,564,450 ක මුදල් අයවිය යුතුව තිබුණි. | තව දුරටත් අයකර ගත යුතුව පවත්නා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් අයකර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවන ලද මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (එ) | 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමිකයන්ගෙන් අයකරගත යුතු මුදලට වඩා වැඩිපුර අයකිරීම් ලෙස රු.2,822,906 ක් හඳුනාගත හැකි වූ අතර, අයකරගත යුතු මුදලට වඩා අඩුවෙන් අයකිරීම රු.3,461,572 ක් විය. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි අය කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව. | විශ්‍රාමිකයින්ගෙන් අයකරගත යුතු මුදල් නිවැරදිව අයකළ යුතුය. |
| (ඒ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක විශ්‍රාමිකයන් 14 දෙනෙකු සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් නැවත අයකර ගැනිමට පෙර එම විශ්‍රාමිකයින් මියයාම නිසා 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගත නොහැකිව පවතින ශේෂය රු.2,251,301 ක් විය. මෙම වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප වගකිව යුතු පාර්ශවයන්ගෙන් නැවත අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර අවස්ථාවේ, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි, වැන්දඹු වැටුප් ගෙවීමේදී මු.රෙ.107 පරික්ෂණය පරිදි, අයකර ගැනීමට කටයුතු කරන බව. | මියගිය විශ්‍රාමිකයින්ගෙන් අයවිය යුතු මුදල් වැන්දඹු වැටුප් ගෙවීමේදී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළව මිය ගිය නිලධාරින් 9 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු රු.1,127,445 ක දේපල, විශේෂ, උත්සව, පාපැදි හා ආපදා ණය මුදලක් පැවති අතර, එම ණය ශේෂවල අයනොවීම් කාලපරාසය වර්ෂ 01 ක සිට වර්ෂ 20 ක් දක්වා විය. | විශ්‍රාම වැටුපෙන් ණය අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇති බව. | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | බමුණාකොටුව, මහව සහ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ග්‍රාම සේවා වසම් 08 ක් තුල පිහිටි රජයේ ආයතනවලට අදාල ඉඩම් හා ගොඩනැගිලි එම ආයතන වෙත පවරා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත්ව වර්ෂ 3 ක සිට වර්ෂ 13 ක් දක්වා කාලයක් ගතවී ඇතත්, එම ඉඩම් පවරාදීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | අදාළ ලිපි ලේඛන පළාත් ඉඩම් කොමසාරිස් වෙත පිටපත් සහිතව යවා ඇති බව. | රජයේ ආයතන වලට අදාළ ඉඩම් හා ගොඩනැගිලි එම ආයතන වෙත විධිමත් පරිදි පවරා දීමට කටයුතු කල යුතුය. |
| (ක) | 2014/2015 අයවැය යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් යතුරුපැදි සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක විශ්‍රාම යාම, මිය යාම හා සේවය පහ කිරීම මත නිලධාරින් 07 දෙනෙකුගෙන් රු.676,600ක මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ මුදල් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලබාදුන් යතුරුපැදි සඳහා නිලධාරින්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ග) | වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තම්මිට පාසල, සඳගල දකුණ හා රංජනගම පිහිටි සමූපකාර ගොඩනැගිලි භාවිතයට නොගැනීම හේතුවෙන් විනාශ වෙමින් පවතින නමුත් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිහිටි ඉඩම සඳහා උරුමකරුවන් ඉදිරිපත් වී ඇති බැවින් තම්මිට පාසල පිහිටි ඉඩම පවරා ගැනීමට නඩු පවරා ඇති අතර අනෙක් ඉඩම් දීර්ඝ කාලීන බදු ලබාදීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින බව . | නිෂ්කාර්යව පවතින ගොඩනැගිලි සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගත යුතුය. |
| (ච) | නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මරදගොල්ල ග්‍රාම නිලධාරි වසමේ මරදගොල්ල පොදු භූමිය, සේවා පියස, දිවා රාත්‍රී ක්‍රීඩාපිටිය, ප්‍රජාශාලාව හා ආපදා කළමනාකරණ ශාලාවකින් සමන්විත වන අතර මෙම ඉඩමේ ඉදිරිපස කොටසින් අනවසර අල්ලා ගැනීමක් සිදුවී ඇති අතර, අක්කර 02 ක් පමණ වන මෙම පොදු භූමිය හරහා අසල්වැසි නිවසකට යාම සඳහා අඩි 07 ක් පමණ පළලට අඩි 300 ක් පමණ දුරට ABC අතුරා වාහන ගමන් කළහැකි මාර්ගයක් අනවසරයෙන් ඉදිකරගෙන තිබුණි. | අනවසර ඇතුළුවීමක් සිදුකර ඇති ද යන්න නිශ්චිතව අණාවරනය කරගැනීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කච්චේරි මිනින්දෝරු වෙත මැනුම් ඉල්ලීම යොමුකර ඇත. ඉඩමේ ඇති බුදු මැදුර ඉදිකිරීම හා සමිති ශාලාව අලුත්වැඩියා කිරිම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය කළ වාහන හේතුවෙන් වලවල් සෑදීම නිසා ABC අතුරා පාර සකස්කර ඇති බව. | රජයට අයත් ඉඩම් අනවසර පුද්ගලයින් අල්ලාගැනීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ජ) | කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි රජයට අයත් දෙහිගම නුගගහමුලහේන ඉඩමේ පිහිටි අඩි 40x20 පමණ ප්‍රමාණයක වූ ගොඩනැගිල්ල හා එම ඉඩම වර්ෂ 29 ක පමණ කාලයක් අනවසර පදිංචිකාරිණියක විසින් භුක්ති විඳින අතර, මේ දක්වාම ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ඉඩම වසර 33 1/3 ක නිරවුල් රජයේ භුක්තිය පවතින බැවින්, ඉඩම රජය සතුකොට ඉදිකිරීමේදී ඵලදායි ලෙස යොදා ගැනීමට ඉදිරි කටයුතු කරන බව. | රජයට අයත් ඉඩම් අනවසර පුද්ගලයින් අල්ලාගැනීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුය. |

**4. යහපාලනය**

**4.1 විගණන හා කළමනාකරණ කමිටුව**

.

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2018 අගෝස්තු 07 දිනැති අංක.06/2018 චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අවම වශයෙන් කාර්තුවකට එක් වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, නිකවැරටිය, ඇහැටුවැව හා වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | 2023 වර්ෂය සඳහා කමිටු 2 ක් පවත්වා ඇත.දෙවන කාර්තුවේ කමිටු පැවැත්වීමට යොදාගත් දිනයේ වෙනත් රැස්වීම් යෙදී තිබුණ බව. | චක්‍රලේඛ අනුව විගණන හා කළමනාකරණ කමිටු පැවැතිවිය යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ස්ථිර පත්වීම් නොලැබූ බහුකාර්ය සංවර්ධන සහායකයින් 324 ක ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටියද, අනුමත තනතුරක නිශ්චිත රාජකාරියක සේවයේ යොදවා නොතිබුණි. | බහුකාර්යය සංවර්ධන කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් මත පිළියෙල කරන ලද මාර්ගෝපදේශයන් පමණක් ඔවුන් අනුයුක්ත කිරීමේදී ලබා දී ඇති අතර, ප්‍රාදේශීය ලේකම් විසින් මෙම සහායකයින් වෙත තාවකාලික රාජකාරි පැවරීමක් සිදුකර ඇත බව. | ස්ථිර පත්වීම් නොලැබූ බහුකාර්ය සංවර්ධන සහායකයින් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |